# බ්‍රිතාන්‍ය පාලන සමයේ ඉදිකළ හඳුරුක්කන්ද තේ කර්මාන්තශාලාව හා ඒ ආශ්‍රිත වර්තමාන තත්ත්වය පිළිබඳ විමර්ශනයක්

ඩබ්ලිව්.ඒ.ඩී.ජේ.ජේ.සී. ජයසිංහ

පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
janithjayanath7@gmail.com

**මුඛ්‍ය පද** - කාර්මික උරුමය, වතු වගාව, තේ කර්මාන්ත ශාලා, බ්‍රිතාන්‍ය, බ්‍රිතාන්‍ය පාලන සමය.

## හැඳින්වීම

යටත් විජිත පාලන සමය තුළ බ්‍රිතාන්‍යයන් මෙරට දී සිදු කළ කාර්යභාරය අතිමහත් ය. එහි දී ඔවුන් විසින් කාර්මික විප්ලවයේ ප්‍රතිඵල ලෙස වැවිලි කර්මාන්තය ශ්‍රී ලංකාව තුළ ආරම්භ කරනු ලැබුවේ කන්ද උඩරට ප්‍රදේශය මූලික කරගෙන ය. එලෙස වැවිලි කර්මාන්තය උඩරට ප්‍රදේශයට ලැබීමත් සමග ඒ හා බද්ධ වූ සංස්කෘතිකාංග උඩරට ප්‍රදේශයේ සමාජ සංස්ථාව දේශීයත්වයෙන් ඔබ්බට ගොස් ක්‍රියාත්මක විණි. බ්‍රිතාන්‍යයන් උඩරට ප්‍රදේශය මූලික කරගෙන වැවිලි කර්මාන්තය ආරම්භ කළ ද ඔවුන් මෙරට තවත් ප්‍රදේශයන් රැසකම මෙම වැවිලි කර්මාන්තය බිහි කරන ලදි. උඩරටින් බැහැර බ්‍රිතාන්‍යයන් ආරම්භ කළ වැවිලි කර්මාන්ත ප්‍රදේශයක් ලෙස ඉඳුල්ගොඩකන්ද ග්‍රාමයට අයත් හඳුරුක්කන්ද තේ වතුයාය පෙන්වාදිය හැකිය. මෙම තේ වතුයාය ආශ්‍රිතව බ්‍රිතාන්‍යයන් තම කාර්මික හැකියාව උපයෝගිකරගෙන වැවිලි කර්මාන්තයේ කටයුතු පහසු කරගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ගත් අතර ඒත් සමග මෙම ප්‍රදේශයට බ්‍රිතාන්‍ය කාර්මික උරුමයේ ආභාෂය ලැබිණි. ඉඳුල්ගොඩකන්ද ග්‍රාමය ප්‍රමුඛ කර ගත් හඳුරුක්කන්ද තේ වතුයාය හා තේ කර්මාන්ත ශාලාව කවුරුන් ආරම්භ කලේ ද? එය කෙසේ ක්‍රියාත්මක වූයේ ද? එමගින් මෙම ප්‍රදේශයට සිදුවූ බලපෑම් මොනවා ද? යන්න පිළිබඳව විමර්ශනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාව සිදු කිරීමේ මූලික අරමුණ විය.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණ සිදු කිරීම උදෙසා මූලික පියවර වශයෙන් ශ්‍රී ලංකාව තුළ බ්‍රිතාන්‍යයන් සිදු කළ යටත් විජිත උරුමයන් පිළිබඳ විශේෂයෙන් අවධානය යොමු කරන ලදි. ඒ සඳහා ප්‍රාථමික මූලාශ්‍රයන් මූලික වශයෙන් භාවිත කළ අතර තෝරාගත් ප්‍රදේශයේ කර්මාන්තශාලාවේ ආරම්භය හා ක්‍රියාකාරිත්වය, ක්‍රියාකාරිත්වයට දායක වූවන් මෙන්ම කර්මාන්ත ශාලාව වටා නිර්මාණය වූ අනෙකුත් උරුමයන් ආදීය පිළිබඳ කරුණු කේ. ජයසේන, යූ. උදය කුමාර හා ඩබ්ලිව්. විමලසූරිය යන මහතුන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා මඟින් අවබෝධ කරගන්නා ලදි. එලෙස සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාවලින් ලබාගත් තොරතුරු විශ්ලේෂණ කිරීමෙන් අනතුරුව ක්ෂේත්‍ර අධ්‍යයනය සිදු කෙරිණි. එසේම අදාළ ප්‍රදේශය මෙන්ම ගොඩනැගිලිවල ඡායාරූප ලබාගනිමින් ගවේෂණ හා වාර්තාගතකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කරමින් පර්යේෂණයට අවශ්‍යය තොරතුරු රැස්කර ගන්නා ලදි.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

එලෙස තේ කර්මාන්ත ශාලාව හා තේ වතුයාය මූලික කරගෙන ඇරඹි බ්‍රිතාන්‍යය යටත් විජිත උරුමයන් තුළින් හඳුරුක්කන්ද තේ වතු යායට හා ඒ අවට පිහිටි බ්‍රිතාන්‍යය ඉදිකිරීම්වලට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. එහි දී බ්‍රිතාන්‍යයන් ඔවුන්ගේ පාලන සමයේ දී ඉදි කළ හඳුරුක්කන්ද තේ කර්මාන්ත ශාලාවෙන් නෙලා ගත් තේ දළු සැපයීම සිදු කරන ලද්දේ හඳුරුක්කන්ද තේ වතුයායේ සිටිය. එලෙස ලබාගත් තේ දළු ප්‍රවාහනය කිරීම සඳහා බ්‍රිතාන්‍යයන් ඔවුන්ගේ කාර්මික තාක්ෂණය උපයෝගි කර ගත්තේ කේබල් යොදා ගෙන ය. එහි දී තේ වතුයායෙන් නෙලා ගන්නා තේ දළු එක්වර ගෝනි දෙක බැගින් කර්මාන්ත

ශාලාව වෙතට ගෙන්වාගනු ලැබුවේ බ්‍රිතාන්‍යයෙන් ආනයනය කළ වානේ කේබල් මඟිනි. තේ වතුයායේ සිට එලෙස ගෙන්වා ගනු ලැබූ තේ දළු බහාලූ ගෝනි ගබඩා කිරීම කරනු ලැබුවේ සම්පූර්ණයෙන් ම තහඩුවලින් නිම කරන ලද දෙමහල් කර්මාන්ත ශාලාව තුළ ය. බ්‍රිතාන්‍යයන් යටත් විජිත උරුමයක් වූ මෙම කර්මාන්ත ශාලාව තුළ සිදු කළ කාර්යයන් අතර තේ දළු වියළීමේ පටන් තේ කුඩු සැකසීම දක්වා සමස්ත ක්‍රියාවලිය සිදු කරන ලදි. එහි දී තේ දළු වියළීම කර්මාන්ත ශාලාවේ දෙවන මහල තුළ සිදු කරනු ලැබුවේ දැව මූලික කරගෙන ය. නෙලා ගත් තේ දළු පසුව පහළ මහලට යොමු කළ අතර වර්තමානයේ දී තේ කර්මාන්ත ශාලාවක සිදුවන සම්පූර්ණ ක්‍රියාවලිය සිදු වූයේ ඩීසල් භාවිතා කරන ලද යන්ත්‍ර සූත්‍ර උපයෝගී කරගෙන ය. නමුත් අද වන විට මෙවැනි තේ නිෂ්පාදන ක්‍රියාවලියක් මෙම ප්‍රදේශය ආශ්‍රිතව දැකීමට නොහැකි වන්නේ 70, 80 දශකයේ දී මෙරට පැවැති භීෂණයන්ට සම්බන්ධ වූ තරුණ පරපුර විසින් රජයේ පොදු දේපළ විනාශ කිරීම මත මෙම යටත්විජිත උරුමය ද ක්‍රි.ව. 1988 දී ගිනිබත් කිරීම නිසාවෙනි. බ්‍රිතාන්‍යයන්ගෙන් පසුව මෙම තේ වතු යාය හා කර්මාන්ත ශාලාවේ භාරකාරත්වය වෛද්‍යය ප්‍රනාන්දු පුල්ලේ මහතා විසින් දැරුව ද මෙම විනාශ කිරීමත් සමඟ ඔහු එය වෙනත් ව්‍යාපාරිකයෙක් වෙත පැවරීම කළ අතර අද වනවිට හඳුරුක්කන්ද තේ වතු යායේ හිමිකාරීත්වය දරනු ලබන්නේ පෞද්ගලික ව්‍යාපාරිකයෙකු විසින් ය. බ්‍රිතාන්‍යයන් ඉදි කළ මෙම හඳුරුක්කන්ද යටත්විජිත උරුමය 1988 විනාශ වී ගිය ද අද පවා සක්‍රීයව තේ වගාව ක්‍රියාත්මක කරනු ලැබේ.

අද මෙම හඳුරුක්කන්ද තේ වතු යායේ නෙලා ගන්නා තේ දළු නිෂ්පාදන ක්‍රියාවලිය උදෙසා කෑගල්ල දිස්ත්‍රික්කයේ කර්මාන්ත ශාලාවක් වෙත ගෙනයනු ලබයි. බ්‍රිතාන්‍යයන් විසින් තේ වතු යායට සමීපව ඔවුන්ගේ වාස්තු විද්‍යාත්මක තාක්ෂණය උපයෝගී කරගෙන නිර්මාණය කරන ලද බංගලාවක් දැකිය හැක. බ්‍රිතාන්‍ය යටත් විජිතයක් උරුමයක් වූ හඳුරුක්කන්ද තේ වතු යාය හා කර්මාන්ත ශාලාව මෙම ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වූ නිසා සමාජ විපර්යාසයන් රාශියක් සිදු විණි. එහි දී වතුයායේ හා කර්මාන්ත ශාලාවේ කාර්යයන් සිදු කිරීම උදෙසා අඩු වැටුපට සේවය කරන ඉන්දීය වතු කම්කරුවන් යෙදවීමට බ්‍රිතාන්‍යයන් කටයුතු කරන ලදී. එවැනි පිරිසක් මෙම ප්‍රදේශය වටා ජීවත් වීමත් සමඟ හින්දු සංස්කෘතියක් හඳුරුක්කන්ද ප්‍රදේශය තුළ ස්ථාපිත විය. එහි ප්‍රතිඵලයක් ලෙස වාස්තු විද්‍යාත්මක ගොඩනැගිලි මෙම ප්‍රදේශය තුළ ඉදිවිය. එසේ ඉදි වූ නිර්මාණ අතර හින්දු කෝවිල හා ක්‍රිස්තියානි පල්ලිය ජනයාගේ වන්දනයට පාත්‍රවන සුවිශේෂී ගොඩනැගිලි ද්විත්වයක් ලෙස හඳුන්වාදිය හැක. තවද අද ජනයා විසින් "කොඩි කට්ටිය යාම" නමින් හැඳින් වූ උත්සවයක් සංවිධානය කර කිරි ඉතිරවීමක් සිදු කරන්නේ තේ වත්ත පිහිටි භූමිය සමීපයේ ය. මෙම හඳුරුක්කන්ද තේ කර්මාන්තශාලාව හා වතුයාය මූලික කරගෙන සෑම වසරකම ජනවාරි මස පළමු දින තේ වත්ත පිහිටි භූමියේ විවිධ වත් පිළිවෙත් පවත්වා දෙවියන්ගෙන් අයදිනු ලබන්නේ තම ප්‍රදේශයට ආරක්ෂාව හා සෞභාග්‍යය වේ. ඒ අනුව පෙනීයන්නේ සංස්කෘතිය තුළ පවතින්නා වූ අනු අංගයක් වන අස්පර්ශනීය උරුමයන් ද මෙම ප්‍රදේශ ආශ්‍රිතව පවතින බවත් ඒවායේ බිහිවීම බ්‍රිතාන්‍යයන්ගෙන් ඇරඹි හඳුරුක්කන්ද තේ වතු යායේ හා කර්මාන්ත ශාලාවේ කටයුතු සඳහා පැමිණි දකුණු ඉන්දීය වතු කම්කරුවන් මූලික වූ බවයි. නමුත් 70 , 80 දක්වාම සක්‍රීයව පැවති මෙම තේ කර්මාන්ත ශාලාව විනාශ වීම නිසා අද වන විට කර්මාන්ත ශාලාව තිබුණු ස්ථානයේ රජයේ තැපැල් කාර්යාලය දැකීමට හැකි වන්නේ මෙරට ට හිමි යටත්විජිත උරුමයක අභාවය පෙන්වමිනි.

බ්‍රිතාන්‍යය පාලන සමය වූ කලී මෙරට ට සුවිශේෂී වූ උරුමයන් රැසකගේ දායකත්වය ලබා දුන් අවධියක් ලෙස පෙන්වාදිය හැක. එලෙස දායාද වුණු උරුමයන් අතර වතු වගාව මූලික කරගත් තේ වගාවට ප්‍රමුඛ ස්ථානයක් හිමි වන්නේ බ්‍රිතාන්‍යයන් තේ වගාව වර්ධනය කිරීමට උපරිම දායකත්වයක් ලබා දීම නිසාවෙනි. එසේ ආරම්භ කරන ලද සුවිශේෂී වතු යායක් හා කර්මාන්ත ශාලාවක් ලෙස ඉදුල්ගොඩකන්ද ග්‍රාමයට අයත් හඳුරුක්කන්ද තේ වතු යාය හා

කර්මාන්ත ශාලාව පෙන්වාදිය හැක. එහි දී හින්දු සංස්කෘතිය මූලික කර ගත් ජනතාවක් බිහි වීම හා ඔවුන්ගේ සංස්කෘතිකාංග ද මෙම ප්‍රදේශ ආශ්‍රිතව බිහි විණි. ඒ බව බ්‍රිතාන්‍යය යටත්විජිත උරුමයක් වූ මෙම තේ කර්මාන්ත ශාලාව හා වතු යාය පිළිබඳ සිදු කරනු ලැබූ පර්යේෂණ මඟින් මනාව නිගමනය කිරීමට හැකියාව ලැබේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**

**(සම්මුඛ සාකච්ඡා)**

ජයසේන, කේ. (අවු. 75), හඳුරුක්කන්ද, විශ්‍රාමලත් තේ වතුකම්කරු, 2023 ජුනි 11.

උදයකුමාර, යූ. (අවු. 69), හඳුරුක්කන්ද, විශ්‍රාමලත් තේ වතුකම්කරු, 2023 ජුනි 11.

විමලසූරිය, ඩබ්ලිව්. (අවු. 67), හඳුරුක්කන්ද, විශ්‍රාමලත් සාමවිනිසුරු, 2023 ජුනි 13.